# විද්‍යෝදය සාහිත්‍ය සම්මාන ප්‍රදානය 2022
# වසරේ විශිෂ්ටතම නවකතාව

(විද්‍යෝදය සාහිත්‍ය සම්මාන ප්‍රදානය 2022හි, වසරේ විශිෂ්ටතම නවකතාව පිළිබඳ විනිශ්චය ඉදිරිපත් කළ අවසන් තීරකයාගේ නිරීක්ෂණ සටහන් ඇතුළත් දේශනය ආශ්‍රයෙන් සකස් කරන ලද්දකි.)

සුභ සන්ධ්‍යාවක් ඔබ සැමට. ගෞරවනීය මහා සංඝරත්නය ප්‍රමුඛ සම්භාවනීය අමුත්තන් ගෙන් අවසරයි. ප්‍රථමයෙන්ම කිව යුතු දෙයක් වන්නේ විද්‍යෝදය සාහිත්‍ය සම්මාන සඳහා ඇගයීමට යොදා ගැනුණේ ඒ සඳහා විශ්වවිද්‍යාලයට ලැබුණු කෘතී පමණයි. ඒවා ඇගයීමේදී පළමු හා දෙවන වටවලදී විනිශ්චය සඳහා බොහෝ පිරිසක් සහභාගි වුවද, පැහැදිලි නිර්ණායක ඒ සඳහා යොදා ගැනුණද, මේ ඇගයීම්, විනිශ්චයන් සියල්ල සාපේක්ෂයි. නිරපේක්ෂ වන්නේ නැහැ. ඔබ සියලු දෙනා ඒ පිළිබඳ දැනුම්වත්. මෙවර නවකතා ඇගයීම සඳහා අප නිර්ණායක කිහිපයක් භාවිත කළා. තේමාත්මක නව්‍යත්වය, ස්වාධීනත්වය, ප්‍රති නිර්මාණාත්මක තාක්ෂණ විධි, ආකෘතිය හා නිරවද්‍ය හා උචිත භාෂා භාවිතය එම නිර්ණායකයි. මගේ කතාවේදී අවසන් වටයට නිර්දේශ වූ කෘති පහ පමණක් ඇගැයීමට මා බලාපොරොත්තු වෙනවා. විනාඩි දහයක් වැනි කෙටි කාලයක් තුළ හැකි උපරිම සාධාරණ ඇගයීමක් සිදු කිරීමට මා උත්සහ කරනවා.

ප්‍රථමයෙන් මගේ අවධානයට යොමු වන්නේ ශමෙල් ජයකොඩි විසින් රචිත මගේ චිකාගෝ හදවත නමැති කෘතියට. එය සරසවි ප්‍රකාශනයක්. එකිනෙකට හාත්පසින්ම වෙනස් වූ සංස්කෘතීන් දෙකක උරුම අතර අතරමං වූ උදාරගේ කතාව මගේ චිකාගෝ හදවත. සංක්‍රමණික මිනිසුන් මුහුණ දෙන සාමාන්‍ය අනන්‍යතා අර්බුදය මැනවින් කියා පෑමට කතුවරියට මෙම කෘතිය මගින් හැකියාව ලැබී තිබෙනවා.
උදාර - " අම්මා දන්නවද මම කල්ලෙක් වෙන එක අත ඇරලා සුදු මිනිහෙක් වෙනවා මට දැනෙනවා" (282 පිටුව).

එම පිටුවෙහිම " මිතුරන් ගෙන් මිදී සුදු තරුණයන් මැද්දේ සිටින විට ජීවිතය කනපිට පෙරළා මගේ ඇතුළාන්තය දෙස බලන්න මට බල කළේය. සුදු සිසුන්ට මා විශ්වාසයෙන් තොර යමකි.

උගත් කල්ලෙක්. උගත් බුද්ධිමත් කල්ලෙක්. උගත් බුද්ධිමත් දුරවබෝධය ඇති කල්ලෙක්" (282 පිටුව).
වස්තු විෂයටම උචිත භාෂා ශෛලියකින්ද, ආකෘතියකින්ද යුතු වුවත් තේමාත්මක නව්‍යත්වයක් මගේ චිකාගෝ හදවත තුළින් ප්‍රත්‍යක්ෂ වූයේ නැහැ.

මියුසස් ප්‍රකාශනයක් වන සේපාලි මායාදුන්නේගේ හිත් දොස් මාලේ, කතුවරියගේ වචනවලින්ම කිවහොත් කුඩා යකුන් විසින් සිඳ බිඳ දමන ලද වන්නි හත්පත්තුවේ සාමාන්‍ය ජනතාව මුහුණ පෑ ව්‍යසනයේ මාල කතාවයි. කතාව පුරාම දිවෙන්නේ උන්හිටිතැන් පමණක් නොව තම පාරම්පරික උරුමය හා අනන්‍යතාව පවා අහිමිව ගිය අන්ත අසරණ මිනිසුන්ගේ ශෝකාලාපයයි. ගයත්‍රි දේවී, වාසනා හාමි වන්නේත්, දුනුකාර මුදියන්සේලා, ගං වැද්දන් වන්නෙත්, පණ්ඩාරම් කල්ලාකෝල්ම්, මහා රජ්ජුරුබණ්ඩාර උන්නාන්සෙ වන්නේත් බලය සහිත සහ රහිතවුන් අතර නිරන්තර දෝලනය නිසයි.
" දුනුකාර මුදියන්සේලාගේ වුණු අප විතරක්ම නොවී තව තවත් වූ මුදියන්සේලා සියල්ලන්ම වන්නි උන්නාන්සේලාට ගං වැද්දන්ම වුනේය. රුස්ස කැලෑවේ ලැගුම් ගත්තා නම් එවුන් හැම එකාම ගං වැද්දන් මය. වන්නි උන්නාන්සේලාගේ රාජකාරියට අප සියල්ලන්ටම කැඳවීම් ලැබුණේ "ගං වැද්දොන්ඩ රාජකාරියට එන්ඩ කියැව්ව" කියන පයින්ඩ යෙනි (34 පිටුව).
"මේ පණ්ඩරම් උන්නාන්සේ ගැන කියැව්වම, උන්නාන්සේ ජම්බුද්දීපය රජ වාසලකින් ආව රජ්ජුරු කෙනෙකුන් වහන්සේ කෙනෙක්. අපේ වරිගෙ බණ්ඩාර ඇත්තෝ වායේ මයි. උන්නාන්සෙ තමුන්නෙ රාජධානිය අතෑරලා දාලා ඇවිදිං තියෙන්නෙ මේ වැව් බැඳි රාජ්ජේ එවුන්ඩ කරුණාව පාණ්ඩ" (216 පිටුව).
කතාව සිදුවූ අවධියට අදාළ සුවිශේෂ භාෂා විලාසය පාඨකයා පුදුමයට පත් කරන සුළුයි. කෙසේ වුවද නව කතාවකින් උත්පාදන කළ යුතු රසය දනවන කතන්දරයකට වඩා හිත් දොස් මාලේ, උඩරට සිට වැව් ගම්මානවලට සංක්‍රමණය වූ අසරණ මිනිසුන් ගැන ලියැවුණු ඓතිහාසික ලේඛනයක් වැනියි.

සරසවි ප්‍රකාශනයක් වන කීර්ති වැලිසරගේ විසින් රචිත සන්ධ්‍යානන්දය මා තිගැස්මකට ලක් කළ බව නම් කිව යුතුමයි. තේමාත්මක නව්‍යයත්වය අතින් මෙම කතාව අන් කිසිවකට දෙවැනි නොවෙයි.

විශ්‍රාමික යුවළක් මුහුණදෙන සිද්ධි දාමයක් වටා ගෙතුණු කතාව කියවන්නෙකුට දැනෙන්නේ තමන් එහි චරිත දෙස අන්වීක්ෂයකින් බලන සෙයකි. A microscopic gaze.

කතාවේ ප්‍රධාන චරිතය වන ආනන්දගෙන් අප දකින්නේ උවමනාවටත් වඩා ප්‍රවේශමෙන් ජීවත්වන්නට උත්සහ දරන, සැමවිටම සකලවිධ කාර්යයන් පිළිබඳ අවදියෙන් සිටින මිනිසෙක්. " කොයි දේ කළත් කිව්වත් ආනන්ද හිටියෙ අවිශ්වාසයෙන්. කොයි වෙලේ මොකක් වෙයිද, නොවෙයිද දන්නේ නැතුව සැකෙන් ජීවත් වෙන්න වීම කොයිතරම් අපා දුකක්ද කියන එක මේ වෙනකොට ආනන්දට හොඳින්ම දැනිල තිබුණා. කොයි වෙලාවේ වුණත් මොනම දෙයක් හරි වෙලා වීදුරු පාත්තරය බිම වැටිල බිඳිල කුඩු සංසාර වෙන්න පුළුවන් බවට හැම තත්පරේම හිත කිව්වා. මතක් වෙන වාරයක් ගානේ හිත තුවාලයක් වගේ ඔද්දල් වුණා ඒත් ඒක පෙන්නන්න බැරි බව ආනන්ද දන්නවා.'' (246 පිටුව).

ශාරීරික හා මානසික සුවය අතර පවතින්නේ වහා බිඳවැටෙන සුළු, සියුම්, සිත කීරි ගැසෙන තරම් භයානක වෙනසකි. මොනම අයුරකින්වත් ගැළවී යා නොහැකි ජීවන පැටළුමක යථාර්ථය සන්ධ්‍යානන්ද යයි - an inescapable entanglement.

ගොඩගේ ප්‍රකාශනයක් වන එරික් ඉලයප්ආරච්චිගේ නකුල මුනි සංගීතය සිය ආත්මයම, ජීවිතයම හා ජීවන ක්‍රමයම කරගත් මිනිසුන්ගේ ලෝකය විනිවිද දකින කතාවකි. සංගීතයෙහි අප දකින්නේ රටා, ස්වර රටා මිස ස්පර්ශක වස්තූන් නොවේ. Patterns not objects. මූලික සිද්ධාන්ත සේ සැලකිය හැකි මෙම රටා මත පිහිටා සිට ඒවා බිඳ දමමින්, සුසංයෝජනය කරමින්, පුරෝකතනය කළ නොහැකි, අලුත් රටාවක් බිහි කිරීම සංගීතයේදී සිදුවේ. A harmonious interplay of patterns. නකුල මුනි එහි ප්‍රතිමූර්තියයි. බොහෝ දුරට පුරෝකතනය කළ හැකි, සාම්ප්‍රදායික, ඒකාකෘතික ජීවිතය නකුල මුනිහි දීප්තට දරාගත නොහැකි තරම් අමිහිරියි. ඒ අමිහිරි බව සංගීතයේ ප්‍රතිවිරුද්ධාර්ථයයි. එවැනි ජීවිතයක් පවත්වාගෙන යෑමට ඔහුට නොහැකිය. නකුල මුනි තුළ අප මූලිකව දකින්නේ සංගීතය, සාමාන්‍ය ජීවිතය, එහි සබඳතා යන සියල්ලෙන් සම්ප්‍රදාය හා ඒකාකෘතිය අතික්‍රමණය කරන, එසේ කරන්නට වෙහෙස දරන සහ ඒ වෙහෙස තුළ දිනන පරදින මිනිසුන්ගේ කතාවයි.

" ඇනෙක්සයේ ගෙවා ඇති ජීවන රටාව කොයි තරම් ලජ්ජා සහගත එකක්ද යන බව තහවුරු වෙන අතරේ නම්බුකාර පිරිමියෙකුට නොගැලපෙන ඒ ජීවිතයට උඩගෙඩි දී තිබෙන්නේ සංගීතය බව ඔප්පු විය. ඔවුන් විසින් පවසන ලද දේ වලින් දීප්තිටද හැඟුණේ සංගීතයේ සැබෑ ජීවන රටාව ඉතා අවලස්සන එකක් බවය '' (314 පිටුව).

ඒ නයින් බලන කල, නකුල මුනි පාඨකයා කැළඹීමට පත් කරන සිතන්නට පොලඹවන ගැඹුරු කෘතියකි.

සරසවි ප්‍රකාශනයක් වන චන්ද්‍රරත්න බණ්ඩාරගේ ප්‍රේමානිශංස, පිරිපුන් ජීවිතය - life in its fullness යනු කුමක් දැයි ගැඹුරින් විමර්ශනයට ලක් කරන, ගැඹුරු චින්තනයක් වෙත පාඨකයා පොලඹවන කෘතියකි. එය ගෙවා නිම කරන්නට නොහිතෙන තරම් මිහිරි වූත්, ආදරණීය වූත් චාරිකාවකි. සදාකාලිකවම එහි අතරමං වන්නට ඇත්නම් යැයි සිතෙන තරමටම එය චමත්කාරජනකය. ආස්වාදජනකය. ඉතිහාසය, පුරාවිද්‍යාව, සංස්කෘතිය, කලාව, ධර්මය, අනුරාගය, උරුමය, අනන්‍යතා ගවේෂණය ආදි බොහෝ තේමා ඔස්සේ සුමටව ගලා ගියද කෘතිය පුරාම නොබිඳෙන හුයක් සේ බැඳී පවතින්නේ - සංස්කෘතිකව දියුණු මිනිසකුගේ ජීවිතය තුළ ධර්මයෙහි කාර්යභාරයයි - (ධර්මය එහි ගැඹුරුම අර්ථයෙන්).

''සයුරු - "සියලු ධර්ම මාර්ගයන් එකම පොදු ඉලක්කයක් වෙත යොමුවී ඇතැයි ඈ සිතන්නීය" (6 පිටුව).

''සයුරු - "නිල නොනිල තහංචි කල් ඇතිව ඉවත් කර ගනිමින් ජීවත්වීමේ සාරය කල් ඇතිව සොයාගත් සිද්ධාර්ථ කෙනෙකුගේ පසු පරම්පරාවේ අර්ථවත් සුවඳ නිරූ මා වෙත හෙලූ හුස්මේ රැඳී තිබුණි (18 පිටුව).

නිරූ- " ඒක මට කියන්න තේරෙන්නෙ නෑ. ඒක අපේ cultural ego එක. ඒකට art විතරක් බලල හරි යන්නේ නෑ මේ ස්ථානය යෝජනා කරන religious රියැලිටි එකටත් යටත් වෙන්න ඕනෑ "
නිරූ දළදා මාලිගාව හා ඒ අවට ගොඩනැගිලි වෙත දෑතම දිග කරමින් පැවැසුවාය'' (118 පිටුව).

''නිරූ "මේ තරම් පිරිසුදු කමක් අපි අතර කවදාවත් තිබිලා නෑ. අපේ දෙවිවරු හොඳට කන බොන රමණයේ යෙදෙන උදවිය. බ්‍රහ්මචාරී සාන්තුවරු නෙමේ" නිරූ පැවසුවේ සිනාසෙමිනි (179 පිටුව).

''සයුරු "මේක දෙවියෝ බුදුන් නැති පන්සලක් යාළුවා. මේ සල්ලිකාරයන්ගේ මල විකාර. මම ඔහුට කීවෙමි'' (215 පිටුව).

නිරූ - "අර ඇතුළෙදි කිව්ව විදිහට ආයෙත් පාංශුකූල ගාථා කියන්න'' (419 පිටුව).

ධර්මය හා ජීවිතය පිළිබඳ මෙම ගැඹුරු සංවාදයට අමතරව ඉතිහාසය හා පුරාවිද්‍යාව යන විෂයවල සැබෑ අරුතද මෙම කෘතිය තුළ තාර්කික සංවාදයට ලක් වේ.

''නිරූ - " ඉතිහාසයයි පුරාවිද්‍යාවයි කියන්නේ 2500 කෙළවර හොයන එක විතරක් නෙමෙයි. මෑත අතීතයට අයිති තවමත් තියෙන අතපත ගෑ උරුමය හොයන එකත් ඉතිහාසය. …

ඉතිහාසය කියලා ලියවිලා තියෙන්නෙ රජවරුන්ගේයි ප්‍රභූන්ගේයි වැඩ ගැන විතරක් නම් ඒ ඉතිහාසය හරි දුප්පත් සයුරු'' (191 පිටුව).

අතහැර යා නොහැකි, උසුලාගෙන යාමටත්, නොහැකි පාරම්පරික උරුමයක ආනිශංස අතික්‍රමණය කරමින්, ප්‍රේමය යෝජනා කරන වඩාත් ලිබරල් ගැඹුරු ආනිශංස විඳ ගනිමින් තමන්ට අනන්‍ය, සිය ආත්මය සොයා ගන්නට වෙර දරන සයුරු අපට පවසන්නේ ඉතිහාස පුරාවිද්‍යා අධ්‍යයනයේ, සංස්කෘතික කලා ධර්ම ගවේෂණයේ ගැඹුරුම අරුත් පසක් කරගත හැක්කේ ප්‍රේමියේ ආනිශංස විඳින්නට හැකි දියුණු සංස්කෘතික මිනිසුන්ට පමණක් වන බවයි.

මෙම කරුණු හැරුණු කොට ප්‍රේමානිශංස නවකතාවේ ආකෘතියේ සුවිශේෂ බවක් දක්නට ලැබෙනවා. හැම පරිච්ඡේදයක්ම පටන් ගන්නේ විශේෂ වූ උද්ධෘතයක් සමගින්. බොහෝ විට එය ලබාගෙන ඇත්තේ භගවද්ගීතාවෙන්. සැමවිටම වාගේ මෙම උද්ධෘතය එම මුළු පරිච්ඡේදයේම සාරාංශයයි. පොතෙහි ඇතුළු කවරයෙහි සඳහන් Martha Rivera Garrido ගේ කවිය මුළු පොතෙහිම සාරාංශය යැයි මට සිතේ. එය කියන්න විනාඩිකුත් තත්පර 34ක් ගත වුණත් ඒ අවස්ථාව මට දෙන්න.

"බොහෝ සේ පොතපත කියවන ගැහැනිය සමඟ ප්‍රේමයෙන් නො බැඳෙන්න.

ලිවීමෙහි යෙදෙන ගැහැනිය සමඟ ප්‍රේමයෙන් නොබැඳෙන්න.

හැඟුම් මාත්‍රයක් ගැඹුරින් අත් විඳින ගැහැනිය සමග ප්‍රේමයෙන් නොබැඳෙන්න.

මනා සේ උගත් ඉන්ද්‍රජාලික, උමතු ගැහැනිය සමග ප්‍රේමයෙන් නොබැඳෙන්න.

සිතන ගැහැනිය සමග ප්‍රේමයෙන් නොබැඳෙන්න.

තමන් දන්නා දේ පිළිබඳ නිවැරදි අවබෝධය ඇති, තමන් පිළිබඳවම විශ්වාස කරන මෙන්ම පියාසරන්නේ කෙලෙස දැයි දන්නා ගැහැනිය සමග ප්‍රේමයෙන් නොබැඳෙන්න.

අනුරාගයේ හැසිරෙන කල සිනාසෙන හෝ හඬන, තම සිරුර තම ආත්මය කර ගැනීමට දන්නා ගැහැනිය සමග ප්‍රේමයෙන් නොබැඳෙන්න.

කවියට පෙම් බඳින ඇයට ඇගේ පාඩුවේ හිඳින්නට ඉඩ හරින්න. (ඔවුන් වැඩිපුර භයානකය.)

නැත්නම් සිතුවමක් අගය කරමින් අඩ පැයක් ගත කරන හෝ සංගීතයෙන් තොරව දිවි ගෙවීමට නොදන්නා ඇය සමග ප්‍රේමයෙන් නොබැඳෙන්න.

දේශපාලනය පිළිබඳ උනන්දු, කැරළිකාර, අයුක්තිය අසාධාරණය හමුවේ දැඩිව කිපෙන ගැහැනිය සමග ප්‍රේමයෙන් නොබැඳෙන්න.

රූපවාහිනිය දෙස ඔහේ ලබා සිටීම ප්‍රිය නොකරන මෙන්ම ඇගේ මුහුණේ හෝ සිරුරේ හෝ හැඩතල කෙසේ පිහිටා තිබුණද, සුන්දරත්වයෙන් යුත් ගැහැනිය සමග ප්‍රේමයෙන් නොබැදෙන්න.

තියුණු මෙන්ම කෙළිලෝල, මනා දැනුමැති නොදැමුණු ගැහැනිය සමග ප්‍රේමයෙන් නොබැදෙන්න.

මක් නිසාද ඇය ඔබ සමග සිටියද, නොසිටියද ඇය පෙරළා ඔබට ආදරය කළද, නොකළද ඇය සමග බැදුණු ප්‍රේමයෙන් ඔබට කිසිදා  අත් මිදෙන්නට නොහැකි වන්නේය.

ඒ අනුව 2022 වසරේ විශිෂ්ටතම නවකතාවට හිමි විද්‍යෝදය සාහිත්‍ය සම්මානය හිමි කර ගන්නේ සරසවි ප්‍රකාශකයන් විසින් ප්‍රකාශිත චන්ද්‍රරත්න බණ්ඩාර රචනා කරන ලද ප්‍රේමානිශංස කෘතියයි.


ආචාර්ය සුජීවා සෙබැස්ටියන් පෙරෙයිරා

ඉංග්‍රීසි හා වාග්විද්‍යා අධ්‍යයනාංශය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය